
# ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තිය




## ධීවර සහ ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

## 2018

# ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තිය

## 1. හැඳින්වීම

ධීවර හා ධීවර නිෂ්පාදන සඳහා දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළවල් තුළ පවතින ඉල්ලුම ඉහළ යමින් පැවතීම හේතුවෙන් වෙරළ රාජ්‍යයන්ට සිය ජාතික ආර්ථිකයන්හි ධීවර හා ජලජීවී වගා කර්මාන්තයේ දායකත්වය වැඩි කර ගැනීමේ අවස්ථාවන් නිර්මාණය වී තිබේ. මෙම අවස්ථා වලින් තිරසාර ලෙස ප්‍රතිලාභ ලැබීමට නම් ධීවර හා ජලජීවී කර්මාන්ත පාදක වී ඇති සම්පත් අධිපරිභෝජනයට ලක් නොකර ඒවායේ නිෂ්පාදනය ප්‍රශස්තකරණය කිරීම අවශ්‍ය වේ. ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජීවී වගා සංවර්ධනය සඳහා නව ආයෝජන කළ යුතුව ඇත. මෙම ක්ෂේත්‍රය තුළ ආයෝජනය කිරීමට දේශීය හා විදේශීය ආයෝජකයන් තුළ විශ්වාසය ගොඩ නැංවීම සඳහා මූලික අවශ්‍යතාවයක් වන්නේ රජයේ පොදු ආර්ථික හා සමාජ සංවර්ධන ප්‍රතිපත්තියට අනුකූල ස්ථාවර ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තියක් තිබීම ය. එමෙන් ම ධීවර සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය සඳහා වන කලාපීය හා අන්තර්ජාතික සම්මුතීන්හි දක්වා ඇති අවශ්‍යතාවන්ට ක්ෂේත්‍රයේ සංවර්ධනය හා කළමනාකරණය අනුකූල වන බවට වග බලා ගැනීම ද අවශ්‍ය වේ.

මෙවැනි තත්වයක් යටතේ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය එය යටතේ ක්‍රියාත්මක වන දෙපාර්තමේන්තු සහ නියෝජිතායතන හා එක්ව විස්තීර්ණ උපදේශකත්ව ක්‍රියාවලියකින් අනතුරුව මෙම ලේඛනය මගින් ඉදිරිපත් කොට ඇති ජාතික ධීවර හා ජලජීවී වගා ප්‍රතිපත්තිය සම්පාදනය කර ඇත. මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කිරීම සඳහා අවශ්‍ය උපදේශක සේවාවන් නෝර්වීජියානු රජයේ වෙළඳ, කර්මාන්ත හා ධීවර අමාත්‍යාංශයේ ධීවර හා ජලජීවීවගා දෙපාර්තමේන්තුව විසින් ද්වි-පාර්ශ්වික සහයෝගිතා ගිවිසුමක් යටතේ සපයන ලදී.

## 2. ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රය

වසර දෙදහසකට අධික කාලයක අතීතයකට දිවෙන දීර්ඝ සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය සතුව පවතී. එය වෙරළබඩ ප්‍රජාවගේ ප්‍රාථමික ආර්ථික ක්‍රියාකාරකම් වලින් එකක් විය. විශේෂයෙන් 1948 වසරේ දී ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍ය පාලනයෙන් නිදහස ලැබුවාට පසු, සමුද්‍රීය ධීවර කර්මාන්තය ජීවනෝපාය ක්‍රියාකාරකමක සිට  රුපියල් බිලියන පරිමාණයක කර්මාන්තයක් බවට ක්‍රමයෙන් පත් වී තිබේ. මිරිදිය ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව යනු වසර 75කට නොවැඩි මෑතකාලීන සංවර්ධනයන් වේ. වයඹ පලාතේ ඉස්සන් වගාවන් ස්ථාපනය කිරීමත් සමඟ 1980 දශකයේ මුල් භාගයේ දී වෙරළබඩ ජලජීවී වගාව ආරම්භ විය. මීට බොහෝ පසු කාලීනව, එනම් 2010 දී පමණ සමුද්‍රීය ජලජීවී වගාව අරඹන ලදී.

ශ්‍රී ලංකාවේ ධීවර සම්පත් පදනම වර්ග කිලෝමීටර් 517,500 ක අනන්‍ය ආර්ථික කලාපයකින් ද, වර්ග කිලෝ මීටර 21,500 ක දේශීය ජල තීරයකින් ද, වර්ග කිලෝමීටර 1,580 ක කලපු හා ගං මෝයවල් වලින් ද, වර්ග කිලෝමීටර 5,200 ක මිනිසා විසින් සාදන ලද ජලාශ වලින් ද සමන්විත වේ. බොකු, කලපු, ජලාශ සහ වෙරළබඩ මෙන් ම ජලාශ ආශ්‍රිතව පිහිටා ඇති ඉඩම් ද ජලජීවී වගා සංවර්ධනය සඳහා සම්පත් පදනමක් නිර්මාණය කරයි.

දැනට පවත්නා වෙළඳපොළ මිලගණන් යටතේ ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රය විසින් දළ දේශීය නිෂ්පාදිතයට ආසන්න වශයෙන් 1.4% ක දායකත්වයක් ලබා දෙයි. මෙමගින් පුද්ගලයන් 575,000 (රටේ ශ්‍රම බලකායෙන් 3.7%) කට පමණ ඍජු හා වක්‍ර රැකියා අවස්ථා සපයනු ලැබේ. ඇ.ඩො.මි. 1300 කට වැඩි අගය එකතු කිරීමක් සහිත වර්තමාන (2017) වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 530,000 කට අධික වේ. ටූනා වර්ග, ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන්, මුහුදු කූඩැල්ලන්, විසිතුරු මසුන් ඇතුළත් සමස්ත නිෂ්පාදනයෙන් 5% ක පමණ ප්‍රමාණයක් අපනයනය කරමින් මෙම ක්ෂේත්‍රය විසින් ඇ.ඩො.මි. 250 කට අධික අපනයන ආදායමක් ද උපයයි. පොදු ජනතාව ගේ ප්‍රධාන සත්ත්ව ප්‍රෝටීන ප්‍රභවය වන්නේ මත්ස්‍ය පරිභෝජනයයි. රටේ සමස්ත මත්ස්‍ය පරිභෝජන අවශ්‍යතාවයෙන් 65% ක් වර්තමානයේ දී සපුරාලනු ලබන්නේ දේශීය මත්ස්‍ය සැපයුමෙන් වන අතර ඉතිරිය ආනයනය කරනු ලබන මසුන්ගෙන් සපයා ගනු ලැබේ. දේශීය ධීවර හා ජලජීවී වගා නිෂ්පාදනය මගින් සමස්ත මත්ස්‍ය අවශ්‍යතාව සපුරා ගැනීමට හෝ ඊට විකල්පයක් ලෙස මත්ස්‍ය අපනයන ආදායමේ කොටසකින්, දේශීය පරිභෝජනය සඳහා කරනු ලබන මත්ස්‍ය ආනයනයන් ගේ පිරිවැය සපුරා ගැනීමට රජය අපේක්ෂා කරයි.

## 3. සංවර්ධන අරමුණු

ධීවර හා ජලජීවී වගා ක්ෂේත්‍රය තුළ මෙම නව ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීම රජයේ අපේක්ෂාව වේ

.

1. විද්‍යානුකූල පදනමකින් යුත් (science – based) තොරතුරු භාවිතා කරමින් සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම.
2. කලාපීය හා ජාත්‍යන්තර බැඳීම් වලට අනුකූල වීම.
3. සමුද්‍රීය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
4. ජලජීවී වගා සහ මිරිදිය ධීවර නිෂ්පාදනය ඉහළ නැංවීම.
5. පසු අස්වනු හානි අවම කිරීම සහ අගය එකතු කිරීම ඉහළ නැංවීම.
6. ඒක පුද්ගල මත්ස්‍ය පරිභෝජනය ඉහළ නැංවීම.
7. අපනයන ආදායම් ඉහළ නැංවීම.
8. විනෝදාත්මක ක්‍රියාකාරකම්, රැකියා හා ව්‍යාපාරික සංවර්ධනය සඳහා පවතින අවස්ථා ඉහළ නැංවීම.
9. ධීවර ප්‍රජාවන්ගේ සමාජ - ආර්ථික ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම.

## 4. ප්‍රතිපත්ති

සමුද්‍රීය ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය, පාරිභෝගිකයෝ සහ වෙළඳපොළ, නිල් ආර්ථිකය සහ වෙනත් අංශ යන ක්ෂේත්‍ර 05 ක් යටතේ මෙම ප්‍රතිපත්ති සංවර්ධනය කොට තිබේ. අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 2018 – 2025 කාලසීමාව තුළ ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් හා ආයෝජනයන් අන්තර්ගත කොට සම්පාදනය කරනු ලබන ප්‍රධාන සැලැස්මකට (Master Plan) අනුව මෙම එක් එක් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු ඇත.

### 4.1. සමුද්‍රීය ධීවර කර්මාන්තය

ශ්‍රී ලංකාවේ වර්තමාන (2017) ජාතික මත්ස්‍ය නිෂ්පාදනය ටොන් 530,000 කට අධික වේ. මෙම ප්‍රමාණයෙන් ටොන් 450,000 (85%) ක් පමණ දේශීය ජල තීරය හා අනන්‍ය ආර්ථික කලාපය සහ මහ මුහුදේ සිදු කරන ධීවර කර්මාන්තය ඇතුළත් සමුද්‍රීය ධීවර කර්මාන්තයෙන් ලබා ගනු ලැබේ. මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවිය යුත්තේ තිරසාර පදනමෙන් වන අතර ඒ සඳහා පාලනයක් සහිතව දේශීය ධීවර යාත්‍රා ඇණිය පුළුල් කිරීම හා සම්පත් කළමනාකරණය ඉහළ නැංවීම වැනි ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වේ. සමුද්‍රීය ධීවර කර්මාන්තයට අදාළ ප්‍රතිපත්ති පහත දැක් වේ.

<u>සම්පත් තිරසාර ලෙස කළමණාකරණය කිරීම</u>
රජය විසින්:

4.1.1. සමාජ, ආර්ථික හා පාරිසරික විද්‍යාවන්ට අදාල හොඳ ම සාක්ෂි පදනම් කරගෙන සජීවී සාගර සම්පත් තිරසාර ලෙස කළමනාකරණය කිරීම තහවුරු කරනු ඇත.

4.1.2. වගකීම් සහගත ධීවර කළමනාකරණයක් ප්‍රවර්ධනය කිරීම සඳහා පරිසර පද්ධති ප්‍රවේශය හා පූර්වාරක්ෂණ ප්‍රවේශය (ecosystem approach and precautionary approach) යොදා ගනු ඇත.

4.1.3. අවදානමට හෝ වඳ වීමේ තර්ජනයට ලක් ව ඇති විශේෂ වල හා ආරක්ෂිත විශේෂ වල තොග ඉහළ නංවනු ඇත.

4.1.4. පැටවුන් බහාලීමෙන් හා වාසස්ථාන වැඩිදියුණු කිරීමෙන් දේශීය ජලතීරය සහ අනන්‍ය ආර්ථික කලාපය තුළ මත්ස්‍ය තොග වැඩිදියුණු කරනු ඇත.

4.1.5. දේශීය යාත්‍රා ඇණියේ අධි-ධාරිතාව වළක්වනු ඇත.

4.1.6. අධි පරිභෝජන ප්‍රදේශවල සිට පරිභෝජනය නොකරනු ලබන හෝ ප්‍රමාණයට අඩුවෙන් පරිභෝජනය කරනු ලබන ප්‍රදේශ කරා සමුද්‍රීය ධීවර ප්‍රයත්න යොමු කරවනු ඇත.

4.1.7. සාපේක්ෂ ලෙස අඩුවෙන් පරිසරයට අහිතකර බලපෑමක් එල්ල කරන ධීවර ක්‍රමවේද හා උපකරණ භාවිතය ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.8. පර්යේෂණ හා සංවර්ධන අරමුණු සඳහා හැරෙන්නට ශ්‍රී ලංකා මුහුදු තීරය තුළ විදේශීය ධීවර යාත්‍රා වලට එරෙහිව පනවා ඇති තහනම තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇත.

4.1.9. ධීවර කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර සම්මුතීන්හි නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුකූල වන්නා වූ වගකීම් සහගත ධීවර කර්මාන්තයක් ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.10. මසුන් සොයා ගැනීම, මසුන්ගේ ගුණාත්මකභාවය රඳා පවත්වා ගැනීම යානාදිය සඳහා අවශ්‍ය නවීනතම තාක්ෂණයෙන් සමන්විත ධීවර යාත්‍රාවලට පමණක් නව ප්‍රවේශය ලැබෙන පරිදි මහ මුහුදේ මසුන් මැරීම සඳහා ප්‍රවේශය ලබා දීම සීමා කරනු ඇත.

<u>පාලනය ශක්තිමත් කිරීම</u>

රජය විසින්:

4.1.11. අනන්‍ය ආර්ථික කලාපය තුළ මත්ස්‍ය තොග නිස්සාරණය රාජ්‍ය භාගයකට යටත් කොට ඉන් ලැබෙන ආදායම ධීවර ක්ෂේත්‍රෙය් කළමනාකරණය සහ සංවර්ධනය සඳහා යොදා ගනු ඇත.

4.1.12. මහ මුහුදේ මසුන් ඇල්ලීම සඳහා දේශීය ධීවර යාත්‍රා වලට මසුන් ඇල්ලීමේ කෝටාවන් වෙන්කර දීම සඳහා ගාස්තුවක් අය කොට ඉන් ලැබෙන ආදායම ධීවර ක්ෂේත්‍රය කළමනාකරණය සහ සංවර්ධනය සඳහා යොදා ගනු ඇත

4.1.13. සැළසුම්කරණය, කළමනාකරණය සහ වාර්තාකරණය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති යොදා ගනු ඇත.

4.1.14. සහ-පාලන හා සහ-කළමනාකරණ ක්‍රමවේද ශක්තිමත් කරනු ඇත.

4.1.15. කාලීන හා අවකාශීය සැලසුම්කරණය (temporal and spatial planning) ශක්තිමත් කරනුඇත.

4.1.16. අවශ්‍ය මානව සම්පත් සංවර්ධනය කරනු ඇත.

<u>මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම</u>

රජය විසින්:

4.1.17. ධීවරයන්ට සඵලදායී ලෙස ධීවර කර්මාන්තයක නිරත විය හැකි ස්ථාන පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා ධීවර පුරෝකථන පද්ධතිය ශක්තිමත් කරනු ඇත.

4.1.18. අනන්‍ය ආර්ථික කලාපයේ ඇති නෙලා ගනු නොලබන හෝ අඩුවෙන් නෙලා ගනු ලබන මත්ස්‍ය තොග නෙලා ගැනීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.19. පන්න කර්මාන්තයේ දී ජීවී ඇම ද ඇතුළත්ව දේශීය වශයෙන් නිෂ්පාදනය කරනු ලබන ඇම භාවිතය ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.20. අදාළ අන්තර්ජාතික සම්මුතීන්ට අනුකූලව වගකීම් සහගත අයුරින් විදේශීය මත්ස්‍ය ගොඩබෑම් ප්‍රවර්ධනය කරනු ඇත.

<u>කලාපීය සහ අන්තර්ජාතික එකඟතාවන්ට අනුකූල වීම</u>

රජය විසින්:

4.1.21. කලාපීය සහ අන්තර් ජාතික ධීවර කළමණාකරණ සමුළුවලට සක්‍රිය ලෙස සහභාගී වනු ඇත.

4.1.22. අන්තර්ජාතික සම්මුතීන් හා කලාපීය ධීවර කළමනාකරණ සංවිධාන මගින් නිශ්චිතව දක්වා ඇති ධීවර කළමණාකරණ ක්‍රමවේද සමඟ අනුගතව කටයුතු කරනු ඇත.

4.1.23. අධි සංක්‍රමණික හා ස්ථානීය මත්ස්‍ය තොග සංරක්ෂණය හා කළමණාකරණය සඳහා සෘජුවම හා කලාපීය ධීවර සංවිධාන හරහා අනෙකුත් වෙරළ රාජ්‍යයන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

4.1.24. ධීවර සම්පත් සංරක්ෂණයේ දී සහ කළමණාකරණයේ දී ආහාර සහ කෘෂිකර්ම සංවිධානය සමග සහයෝගයෙන් කටයුතු කරනු ඇත.

4.1.25. සමුද්‍රීය ශ්‍රමය (maritime labour) සම්බන්ධයෙන් ජාත්‍යන්තර කම්කරු සම්මුතීන් හා ජාත්‍යන්තර සමුද්‍රීය සම්මුතීන්වල දක්වා ඇති අවශ්‍යතාවන්ට අනුගතව කටයුතු කරනු ඇත.

4.1.26. වරාය රාජ්‍යයක් ලෙස අන්තර් ජාතික නීතියට අනුකූලව ආපදා අවස්ථාවන්හී දී විදේශීය ධීවර යාත්‍රා වලට වරාය ප්‍රවේශය සහ ආධාර ලබා දෙනු ඇත.

<u>යටිතල පහසුකම්</u>

රජය විසින්:

4.1.27. ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව හරහා ප්‍රධාන ධීවර වරායන් ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම සිදු කරනු ඇත.

4.1.28. "හරිත ධීවර වරාය" සංකල්පය යටතේ මෙන්ම බහු කාර්යය ධීවර වරායන් ලෙස ධීවර වරායන් ක්‍රියාත්මක කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.29. අනිකුත් යටිතල පහසුකම් ස්ථාපිත කොට ක්‍රියාත්මක කිරීම සඳහා පෞද්ගලික අංශය ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.30. නැංගුරම්පොළවල් හා සුළු පරිමාණයේ මත්ස්‍ය තොටුපළවල් සංවර්ධනය කොට හා ඒවා ක්‍රියාත්මක කිරීම සහ නඩත්තුව අදාළ ප්‍රදේශයන්හි ධීවර ප්‍රජාවන්ට පවරනු ඇත.

<u>ධීවර යාත්‍රා</u>

රජය විසින්:

4.1.31. ධීවර යාත්‍රා ඇණියේ සිදු විය හැකි අධිධාරිතාව පාලනය කරනු ඇත.

4.1.32. ධීවර යාත්‍රාවන්හී ප්‍රමිති සුරක්ෂිතතාව (quality assurance) වැඩිදියුණු කරනු ඇත.

<u>සයුරේ දී ආරක්ෂාව හා වෘත්තිමය ආරක්ෂාව</u>

රජය විසින්:

4.1.33. අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුකූලව සයුරේ දී හා ගොඩබිමේ දී ආරක්ෂිත, සෞඛ්‍යාරක්ෂිත සහ සාධාරණ වැඩ කිරීමේ වාතාවරණයක් ප්‍රවර්ධනය කරනු ඇත.

4.1.34. සයුරේ දී ආරක්‍ෂාව හා වෘත්තීයමය ආරක්‍ෂාව සම්බන්ධයෙන් රක්‍ෂණාවරණ යෝජනා ක්‍රම ඇති කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

## 4.2. ජලජීවී වගාව හා මිරිදිය ධීවර කර්මාන්තය

කලපු, මෝය, ගංගා, නිත්‍ය හා කාලීන ජලාශ සහ විල්ලු ද ඇතුළත් විශාල ප්‍රමාණයේ අභ්‍යන්තර ජල ප්‍රදේශයක් ශ්‍රී ලංකාව සතුව පවතින බැවින් ජලජීවී වගා හා මිරිදිය ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා මනා විභවයක් පවතී. වර්තමානයේ දී වාර්ෂික මසුන් ටොන් 75,000ක් පමණ නිෂ්පාදනය කරනු ලබන ජලජීවී වගා හා මිරිදිය ධීවර ක්ෂේත්‍ර සංවර්ධනය, මත්ස්‍ය නිෂ්පාදනය තිරසාර ලෙසින් ඉහළ නැංවීම සඳහා සාර්ථක විකල්පයක් වේ. මානව අවශ්‍යතා හා අනෙකුත් බොහෝ සංවර්ධන කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන්නා වූ ඉඩම් හා ජල සම්පත් ජලජීවී වගාව සඳහා ද අවශ්‍ය වන බැවින් ජලජීවී වගා සංවර්ධනය හා අනෙකුත් ඉඩම් පරිභෝජන රටා අතර ඝට්ටනයක් ඇති විය හැක. ජලජීවී වගාව මඟින් අහිතකර පාරිසරික බලපෑම් ද සිදු වීමට ඉඩ තිබේ. එබැවින්, ජලජීවී වගා සංවර්ධනය සඳහා පූර්ව අවකාශීය සැලසුම් සහ පාරිසරික, සමාජ - ආර්ථිකමය හා සංස්කෘතික බලපෑම් තක්සේරු කිරීමේ ඇගයුම් ද අවශ්‍ය වේ. ජලජීවී වගා හා මිරිදිය ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා වන ප්‍රතිපත්ති පහත පරිදි වේ.

<u>සම්පත් තිරසාර ලෙස කළමනාකරණය</u>
රජය විසින්:

4.2.1 අභ්‍යන්තර ජලාශයන්හී ධීවර කළමනාකරණය සඳහා පරිසර පද්ධති ප්‍රවේශය යොදා ගනු ඇත.

4.2.2 අභ්‍යන්තර ජලාශයන්හී ජලජ ජෛව විවිධත්වය සුරක්‍ෂණය කිරීම තහවුරු කරනු ඇත.

4.2.3. කළපු වල හා මෝය වල ධීවර කටයුතු වල යෙදෙන ධීවර යාත්‍රාවන් ගේ දිග හා එන්ජින් ධාරිතාවය නියාමනය කරනු ඇත.

4.2.4. ජලාශයන්හී ධීවර කටයුතු සඳහා යාන්ත්‍රික බෝට්ටු භාවිතයට අවසර නොදෙනු ඇත.

4.2.5. ජලජීවී වගා සංවර්ධනයේ දී කාලීන සහ අවකාශීය සැලසුම් අදාළ කර ගනු ඇත.

4.2.6. පාරිසරික, සමාජ - ආර්ථිකමය හා සංස්කෘතික බලපෑම් තක්සේරු කිරීමේ ඇගයුම් ක්‍රියාත්මක කිරීමෙන් පසුව පමණක් ජලජීවී වගා ව්‍යාපෘති සඳහා භූමි සහ ජල සම්පත් වෙන් කරනු ඇත.

4.2.7. අනුමත කිරීමේ කොන්දේසි සමඟ තරයේ අනුකූල වන පරිදි ජලජීවී වගා ව්‍යාපෘති ක්‍රියාත්මක වන බවට වගබලා ගනු ඇත.

4.2.8. ජලජීවී වගාවේ දී මසුන්ගේ හා වෙනත් ජලජ ජීවීන් ගේ සෞඛ්‍යාරක්ෂණය ශක්තිමත් කරනු ඇත.

4.2.9. ජලජීවී වගාව සඳහා යෝග්‍යතම කළමනාකරණ ක්‍රමවේද (BMPs) ගන්නා බවට වගබලා ගනු ඇත.

<u>පාලනය ශක්තිමත් කිරීම</u>
රජය විසින් :

4.2.10. සැලසුම්කරණය, සංවර්ධනය, කළමනාකරණය සහ වාර්තාකරණය සඳහා කළමනාකරණ තොරතුරු පද්ධති භාවිතා කරනු ඇත.

4.2.11. සහ-පාලන හා සහ-කළමනාකරණ ක්‍රමවේද ශක්තිමත් කරනු ඇත.

4.2.12. පාලනය සඳහා අවශ්‍ය වන මානව සම්පත් සංවර්ධනය කරනු ඇත.

4.2.13. සෑම මිරිදිය ජලාශයක ම ධීවර කටයුතු වලින් ලැබෙන ආදායමෙන් කොටසක් එම ජලාශයේ තිරසාර ධීවර කළමනාකරණය උදෙසා යොදා ගනු ඇත.

<u>මත්ස්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම</u>
රජය විසින්:

4.2.14. අභ්‍යන්තර ජලාශයන්හි ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව යෝග්‍ය අන්දමින් සංවර්ධනය කරනු ඇත.

4.2.15. අභ්‍යන්තර ජලාශයන්හි ඇති අඩුවෙන් පරිභෝජනය කරනු ලබන හෝ පරිභෝජනය නොකරනු ලබන මත්ස්‍ය සම්පත් නෙලා ගැනීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.2.16. පරිසර හිතකාමී ප්‍රවේශයන් හරහා ජලජීවී වගාව ව්‍යාප්තකරණය හා තීව්‍රකරණය සිදු කරනු ඇත.

4.2.17. ජලජීවී වගා විශේෂයන් හඳුන්වා දීම සඳහා වන ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ භාවිතා සංග්‍රහය (FAO Code of Practices) හා අනුකූල වන පරිදි දේශීය විශේෂයන් හා විදේශීය විශේෂයන් වගා කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.2.18. ජලජීවී වගාව සඳහා යොදා ගන්නා මත්ස්‍ය විශේෂයන්ගේ ක්‍රියාකාරීත්වය පූර්වාරක්ෂණ මූලධර්ම භාවිතා කරමින් ජානමය වශයෙන් වැඩිදියුණු කරනු ඇත.

## 4.3. පාරිභෝගිකයෝ සහ වෙළඳපොළ

මිනිස් ආහාරයක් ලෙස මසුන් නිෂ්පාදනය කිරීම ලෝකයේ ධීවර කර්මාන්තයේ සහ ජලජීවී වගාවේ මූලික අරමුණ වේ. මත්ස්‍ය පරිභෝජනය මගින් සත්ත්ව ප්‍රෝටීන සැපයීම පමණක් නොව විටමින් A හා D හා කැල්සියම්, අයඩින්, යකඩ, සින්ක් හා සෙලේනියම් වැනි ඛණිජ සහ ක්‍ෂුද්‍ර පෝෂක සංඝටක සපයනු ලැබේ. යහපත් පෝෂණ තත්ත්වයක් මගින්, සාර්ව ආර්ථික සහ සාමාජීය වර්ධනයට උපකාරී වන ඉහළ මට්ටමේ පුද්ගල ක්‍රියාකාරිත්වයක් සහ මානසික තීව්‍රතාවයක් ලබා ගත හැකිය. පෝෂණය සැපයීමට අමතරව, ආදායම් සහ ජීවනෝපාය සපයන්නෙකු ලෙස ද ධීවර හා ජලජීවී වගා කර්මාන්තය ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ආහාර හා කෘෂිකර්ම සංවිධානයට අනුව, ජනතාවකට සෑම අවස්ථාවක දී ම සිය භෝජන අවශ්‍යතා සහ සක්‍රීය මෙන්ම සෞඛ්‍යමත් දිවියක් සඳහා ආහාර රුචිකත්වයන් සපුරා ගත හැකි පරිදි ප්‍රමාණවත්, ආරක්ෂිත පෝෂණීය ආහාර සඳහා භෞතිකමය හා ආර්ථික වශයෙන් ප්‍රවේශයක් පැවතීම ආහාර සුරක්ෂිතතාවය වේ. නිෂ්පාදනය කරනු ලබන හා බෙදා හරිනු ලබන මසුන් මනා ආහාර සෞඛ්‍යාරක්ෂිතතාවයෙන්හා ගුණාත්මක ප්‍රමිතියෙන් යුතුව පසු-අස්වනු හානි වලින් තොරව හෝ පසු-අස්වනු හානි අවමව පැවතිය යුතු අතර එමගින් ඉහළ ආර්ථික වටිනාකමකින් ද යුක්ත විය යුතුය. සෑම ආදායම් කණ්ඩායමකට ම මිල දී ගත හැකි මට්ටමේ සාධාරණ මිලකට මත්ස්‍ය සැපයුමක් දිවයිනේ සෑම ප්‍රදේශයකට ම පැවතිය යුතුය. මසුන් බෙදාහැරීම, අලෙවිය හා අපනයනය මෙහෙයවන ප්‍රතිපත්ති පහත දැක් වේ.

<u>ආහාර සුරක්ෂිතතාවය, ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවය සහ පෝෂණය</u>
රජය විසින්:

4.3.1. වැඩි පිරිසකගේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා ප්‍රමාණවත් ආර්ථික මට්ටම් සහිත රැකියා අවස්ථා ක්ෂේත්‍රය තුළ නිර්මාණය කරනු ඇත.

4.3.2. දේශීය වශයෙන් අලෙවි කරනු ලබන මසුන්ගේ හා මත්ස්‍ය නිෂ්පාදන වල ප්‍රමිතිය හා ආහාර සෞඛ්‍යාරක්ෂිතාව තහවුරු කරනු ඇත

4.3.3. පෝෂණ අවශ්‍යතා සපුරාලීම සඳහා ප්‍රමාණවත් ලෙස මත්ස්‍ය පරිභෝජනය ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.4. මසුන් අඩු කාලයන්හී දී සාධාරණ මිල ගණන් යටතේ මසුන් ලබා ගත හැකි වන පරිදි අධි සැපයුමක් පවතින කාලවල දී ස්වාරක්ෂක තොග ලෙස මසුන් තොග පවත්වා ගනු ඇත.

4.3.5. අගය දාමයෙහි සෑම අදියරක ම නිෂ්පාදනය පිළිබඳ තොරතුරු ලබාගැනීමේ හැකියාව (traceability) සහ විනිවිදශීලීභාවය (transparency) තහවුරු කරනු ඇත

<u>පසු-අස්වනු හානි අවම කිරීම හෝ තුරන් කිරීම</u>
රජය විසින්:

4.3.6. නිෂ්පාදන හා සැපයුම් දාමය තුළ ගුණාත්මක යටිතල පහසුකම් වැඩිදියුණු කරනු ඇත.

4.3.7. මසුන් පරිහරණය කිරීම සඳහා පවතින හොඳම ක්‍රමවේද (best fish handling practices) පිළිබඳව දැනුම වර්ධනය කරනු ඇත.

<u>අපනයනය ඉහළ නැංවීම.</u>
රජය විසින්:

4.3.8. අපනයනය අරමුණු කොටගත් ධීවර කර්මාන්තය සහ ජලජීවී වගා ව්‍යාපෘති සඳහා ආයෝජනයන් ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.9. අන්තර්ජාතික වෙළඳපොලට සරිලන පරිදි ආහාර සුරක්ෂිතතා සහ ගුණාත්මක ප්‍රමිති සපුරමින් මසුන් හා මත්ස්‍ය නිෂ්පාදන නිෂ්පාදනය කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.10 ඉහළ අපනයන හැකියාවක් පෙන්නුම් කරන නව විදේශීය විශේෂයන් ආනයනය කිරීම සහ වගාකිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.11. සජීවී විසිතුරු මසුන් සහ ජලජ විසිතුරු පැලෑටි නිෂ්පාදනය සහ අපනයනය ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.12. නවෝත්පාදන නිෂ්පාදන ද ඇතුළුව වෙළඳපොළට සඳහා අවශ්‍ය (market - driven) ධීවර සහ ජලජීවී වගා නිෂ්පාදන නිපදවීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.13. ජාත්‍යන්තර වෙළඳපොළ තුළ සාපේක්ෂ වශයෙන් ඉහළ මිලක් ලබා දිය හැකි පරිසර හිතකාමී හෝ කාබනික ධීවර හා ජලජීවී වගා නිෂ්පාදන නිපදවීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.14. ශ්‍රී ලංකා නිෂ්පාදන සන්නම් නාමකරණය සඳහා සහය ලබා දෙනු ඇත

4.3.15. අපනයනය සඳහා ධීවර යාත්‍රා, විනෝද ක්‍රීඩා යාත්‍රා සහ අනෙකුත් යාත්‍රා නිෂ්පාදනය ප්‍රවර්ධනය කරනු ඇත.

4.3.16. ධීවර හා ජලජීවී වගා නිෂ්පාදන ද ඇතුළුව සමස්ත නිෂ්පාදනයන්ට, ප්‍රමුඛත්වය දෙනු ලබන ජාත්‍යන්තර වෙළඳපොළවල් වලට ප්‍රවේශ වීමේ හැකියාව වැඩිදියුණු කරන්නාවූ වෙළඳ ගිවිසුම් ඇති කර ගැනීමට කටයුතු කරනු ඇත.

## 4.4. නිල් ආර්ථිකය

සමුද්‍රීය හා වෙරළාසන්න පරිසර පද්ධතීන්ගේ යහපැවැත්ම සංරක්ෂණය කරමින් ආර්ථික වර්ධනය, වැඩිදියුණු කරන ලද ජීවනෝපා සහ රැකියා සඳහා සාගර සම්පත් තිරසාරාත්මක ලෙස උපයෝගී කර ගැනීම "නිල් ආර්ථිකය" නම්වේ. මෙම සංකල්පය යටතේ සමුද්‍රාශ්‍රිත නව ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි යොමු වීමේ ගෝලීය ප්‍රවණතාවක් පවතී. මෙම නව ආර්ථික ක්‍රියාකාරකම් මගින් සාගර සම්පත් උපයෝගී කර ගැනීම ප්‍රශස්තකරණය කිරීමට අමතරව, ඇතැම් ධීවරයන් මසුන් ඇල්ලීමෙන් බැහැර වී අනෙකුත් ආර්ථික ක්‍රියාකාරකම් කෙරෙහි යොමු විය හැකි බැවින් වර්තමානයේ ධීවර සම්පත් කෙරෙහි එල්ල වී තිබෙන පීඩනය අවම කිරීම ද කළ හැකි වනු ඇත.

රජය විසින්:

4.4.1. සජීවී සමුද්‍රීය සම්පත් උපයෝගී කර ගනිමින් නවසමුද්‍රීය කර්මාන්ත ස්ථාපිත කිරීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.4.2. ප්‍රතිලාභ සාධාරණීය ලෙස බෙදී යන ආකාරයෙන්, ඖෂධ සහ වාණිජ වටිනාකමෙන් යුතු ද්‍රව්‍ය ලබා ගත හැකි සමුද්‍රීය ශාක හා සත්ත්ව විශේෂ ගවේෂණය කිරීමේ (marine bio-prospecting) ප්‍රවේශය නියාමනය කරනු ඇත.

4.4.3. උපරිම කාර්යක්ෂමතාව තහවුරු කිරීම සඳහා සමුද්‍රීය ක්‍රියාකාරකම් ඒකාබද්ධකරණය ප්‍රවර්ධනය කරනු ඇත.

4.4.4. ප්‍රධාන ප්‍රවාහයේ ධීවර ක්‍රියාකාරකම් සමඟ නොගැටෙන පරිදි විනෝද ක්‍රීඩාමය ධීවර කටයුතු ප්‍රවර්ධනය කරනු ඇත.

4.4.5. මැරීනා ස්ථාපනය සහ සමුද්‍රීය සංචාරක ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කරනු ඇත.

4.4.6. මත්ස්‍ය තොග ඉහළ නැංවීම හා සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා දියබත් වූ නැව් සංරක්ෂණය කරනු ඇත.

4.4.7. ධීවර වරායන් සංවර්ධනය සහ කලමනාකරණයේ දී "හරිත වරාය" සංකල්පය අදාළ කර ගනු ඇත.

4.4.8. සමුද්‍රීය සහ වෙරළාශ්‍රිත පරිසර සංරක්ෂණය ප්‍රවර්ධනය කරනු ඇත

## 4.5. අනෙකුත් ක්ෂේත්‍ර

සමුද්‍රීය ධීවර කර්මාන්තය, ජලජීවී වගාව සහ මිරිදිය ධීවර කර්මාන්තය, පාරිභෝගිකයන් සහ වෙළඳපොළ සහ නිල් ආර්ථිකය යන අංග වලින් සමන්විත සමස්ත ධීවර සහ ජලජීවී වගා ක්ෂේත්‍රයට අදාළ වන්නා වූ පොදු විෂයයන් මෙම මාතෘකාව යටතේ ආවරණය කෙරේ.

<u>රැකියා අවස්ථා උත්පාදනය</u>
රජය විසින්:

4.5.1. හැකි ආකාරයෙන් ක්ෂේත්‍රය තුළ රැකියා අවස්ථා වැඩි වැඩියෙන් නිර්මාණය කිරීමට කටයුතු කරනු ඇත.

4.5.2. වැන්දඹු කාන්තාවන් හට වැඩි අවධානයක් ලබා දෙමින් ධීවර කාන්තා ප්‍රජාවට ක්ෂුද්‍ර - ව්‍යවසායන් ආරම්භ කිරීම සඳහා සහය වනු ඇත.

4.5.3. අතිරේක ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා යොමු වීමට කාන්තාවන්ට සහ ආන්තිකකරණයට ලක් වූ (marginalized) කණ්ඩායම් වලට පුහුණු හා ශක්‍යතා ගොඩනැංවීමේ අවස්ථා ලබා දෙනු ඇත.

4.5.4. ඒකාබද්ධ තිරසාර සංචාරක කර්මාන්තය ද ඇතුළුව ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම සඳහා ප්‍රජාවන් දිරිගන්වනු ඇත.

4.5.5. සිය ගම්මාන ආශ්‍රිතව පවතින ජල ප්‍රදේශයන්හි ආර්ථික කටයුතු ලෙස ජලජීවී වගා හෝ වගා පාදක ධීවර කටයුතු ආරම්භ කිරීමට ප්‍රජාවන් අභිප්‍රේරණය කරනු ඇත.

4.5.6. පාසැල් අධ්‍යාපනය අවසන් කරන්නන් හට රැකියා ඉලක්ක කර ගනිමින් ධීවර කර්මාන්තය, ජලජීවී වගාව හා නව සමුද්‍රීය කර්මාන්ත ආශ්‍රිත උසස් තාක්ෂණික පුහුණුව ලබා දෙනු ඇත.

4.5.7. විදේශ රැකියා සඳහා නෞපතීන් (skippers) සහ ගැණියන් (crew members) පුහුණු කරනු ඇත.

4.5.8. තිරසාර ජීවනෝපාය සලසන්නාවූ දරිද්‍රතාවය තුරන් කිරීමේ වැඩසටහන් තවදුරටත් ක්‍රියාත්මක කරනු ඇත.

<u>පරිසරය, දේශගුණය සහ ස්වභාවික ව්‍යසනයන්</u>
රජය විසින්:

4.5.9. පාරිසරික හා දේශගුණික විපර්යාස සමඟින් ඇති කරනු ලබන අභියෝගවලට සහ ස්වභාවික විපත් මඟින් ඇති කරනු ලබන බලපෑම්වලට මුහුණ දීම සඳහා ක්‍රමෝපායක් සකස් කරනු ඇත.

4.5.10. මසුන් හා අනෙකුත් සජීවී සාගර ජලජ සම්පත් කෙරෙහි ඍජුව එල්ල කරනු ලබන අහිතකර බලපෑම් සැලකිල්ලට ගනිමින් සමුද්‍ර දූෂණය වැළැක්වීම සඳහා ගත හැකි පූර්වාරක්ෂණ ක්‍රමවේද ක්‍රියාත්මක කරනු ඇත.

4.5.11. ආපදාවට ලක් වන ප්‍රජාවන් වලට නැවත පදිංචි වීම සහ ජීවනෝපායන් නැවත ආරම්භ කිරීම පිණිස සහය ලබා දෙනු ඇත.

4.5.12. ස්වභාවික ව්‍යසනයන්ගේ බලපෑම් වලට පිළියම් යෙදීම සඳහා වගකිව යුතු බලාධිකාරයන් අතර අන්තර්-උපදේශාත්මක ජාල පද්ධතියක් (inter –instructional network system) සම්පාදනය කරනු ඇත.

4.5.13. දේශගුනික විපර්යාස වල බලපෑම් වලට මුහුණ දීම සඳහා ජනතාවගේ ප්‍රකෘතිකරණ හැකියාව (resilience) වර්ධනය කරනු ඇත.

4.5.14. දේශගුණ විපර්යාස හා සම්බන්ධ ගැටලු පිළිබඳ පවතින තොරතුරු හිඟය සපුරාලීම හා එම ගැටලු පිළිබඳ දත්ත පදනමක් (database) නිර්මාණය කිරීමට පර්යේෂණ කටයුතු හා ආයතනික දායකත්වය වැඩිදියුණු කරනු ඇත.

<u>ස්ත්‍රී - පුරුෂ සමාජභාවය</u>
රජය විසින්:

4.5.15. ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සඳහා සහභාගී වීමට කාන්තාවන්ට සම අවස්ථා සැලසීම ප්‍රවර්ධනය කරනු ඇත.

4.5.16. ස්ත්‍රී - පුරුෂ සමාජභාවය සුළු පන්න ධීවර සංවර්ධන ක්‍රමෝපායන්හි අනුකලන (integral) අංගයක් බවට පත් කරනු ඇත.

4.5.17. සම්පත් හා ප්‍රතිලාභ කෙරෙහි සමාන ප්‍රවේශය ලැබෙන ආකාරයේ වාතාවරණයන් ස්ත්‍රී හා පුරුෂ යන දෙපිරිසට ම සලසනු ඇත.

4.5.18. සිය ගැටලු සඳහා විසඳුම් සෙවීමට ඒකාබද්ධව කටයුතු කිරීම පිණිස ස්ත්‍රී හා පුරුෂ දෙපිරිස ම දිරි ගන්වනු ඇත.

<u>ධීවර ප්‍රජාවගේ සමාජ - ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම</u>
රජය විසින්:

4.5.19. ධීවර ප්‍රජාව අධික ලෙස මද්‍යසාර භාවිතයට යොමු වීම වළක්වනු ඇත.

4.5.20. ස්වකීය ප්‍රදේශයන්හී සිදු වන සංවර්ධන කටයුතු හේතුවෙන් පීඩාවට පත් වන ධීවර ප්‍රජාවන් වලට ප්‍රමාණවත් වන්දි ලැබෙන බවට වග බලා ගනු ඇත.

4.5.21. කාන්තාවන් ද ඇතුළුව ධීවරයන් හා මත්ස්‍ය කටයුතු වල යෙදෙන්නන් සඳහා සමාජ ආරක්ෂණ ජාලය (social safety net) හා සමාජ සුරක්ෂිතතා ආරක්ෂණය (security protection) වැඩි දියුණු කරනු ඇත.

4.5.22. සම්ප්‍රදායික, සංක්‍රමණික, යැපුම් හා කාර්මික ධීවර ප්‍රජාවන් සතු භූමිය, ජල ප්‍රදේශ හා මත්ස්‍ය සම්පත සඳහා වන භුක්ති අයිතීන්ට ගරු කරනු ඇත.

4.5.23. සම්පත් අයිතිය හිමිකරුවන් (right holders) එම සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම සඳහා වග කියන බවට බවට වගබලා ගනු ඇත.

4.5.24. මුහුදේ, අභ්‍යන්තර ජලාශ හා ගොඩබිම තුළ ආරක්ෂිත, සෞඛ්‍ය සම්පන්න හා සාධාරණ සේවා තත්ත්වයක් තහවුරු තරනු ඇත.

4.5.25. ධීවර කළමනාකරණ ක්‍රමවේද නිර්මාණය, සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීමේ දී ධීවර ප්‍රජාවන් සහභාගි කර ගනු ඇත.

4.5.26. ධීවරයින්ගේ ශක්‍යතා වර්ධනය කොට ධීවර කළමනාකරණය සඳහා ඔවුන්ගේ සහභාගීත්වය ඵලදායී ලෙස ලබා ගනු ඇත

4.5.27. ධීවර ප්‍රජාව තුල සෞඛ්‍යය, අධ්‍යාපනය, සාක්ෂරතාවය හා ඩිජිටල් අන්තර්කරණය (digital inclusion) වැනි මානව සම්පත් සංවර්ධන ආයෝජනයන් ප්‍රවර්ධනය කරනු ඇත.

4.5.28. ජාතික හා ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන්ට අනුව ප්‍රමාණවත් ජීවන මට්ටමක් ලබා ගැනීම සඳහා සුළු පන්න ධීවරයන්ට හා මත්ස්‍ය කටයුතු වල නිරතවන්නන් හට හිමි අයිතීන් ක්‍රමයෙන් සපුරාලීමට කටයුතු කරනු ඇත.

<u>සහනාධාර</u>
රජය විසින්:

4.5.29. ක්ෂේත්‍රය කළමනාකරණය සඳහා වන මෙවලමක් ලෙස පමණක් සහනාධාර භාවිතා කරනු ඇත.

4.5.30. ධීවරයන් කෙරෙන් සහනාධාර මත යැපීමේ මානසිකත්වය ඉවත් කිරීමට කටයුතු කරනු ඇත.

<u>මූල්‍යකරණ පහසුකම්</u>
රජය විසින්:

4.5.31. ධීවරයන්ගේ මූල්‍ය අන්තර්කරණය (financial inclusion) තහවුරු කිරීම සඳහා මූල්‍යකරණ මෙවලම් සංවර්ධනය කිරීමට පෞද්ගලික මූල්‍ය ආයතන දිරිමත් කරනු ඇත.

4.5.32. සිය මූල්‍ය අවශ්‍යතා සඳහා බැංකු හා ණය පහසුකම් ලබා දෙන අනෙකුත් විධිමත් ආයතන සමඟ ගණුදෙනු කිරීමට ධීවර ප්‍රජාවන් දිරිමත් කරනු ඇත.

<u>පෞද්ගලික අංශයේ දායකත්වය</u>
රජය විසින්:

4.5.33. ක්ෂේත්‍රය තුළ පෞද්ගලික අංශයේ සහභාගීත්වය ප්‍රවර්ධනය කරනු ඇත.

2.5.34. ක්ෂේත්‍රය තුළ ආයෝජනය සඳහා රාජ්‍ය - පෞද්ගලික ව්‍යවසායකත්ව හවුල්කාරීත්වයන් (PPP) ස්ථාපනය ප්‍රවර්ධනය කරනු ඇත.

මානව හිමිකම්
රජය විසින්:

4.5.35. ධීවර හා ජලජීවී වගා සංවර්ධනය සහ කළමනාකරණය කිරීමේ දී මානව හිමිකම් උල්ලංඝණය වීමක් සිදු නොවන බවට වගබලා ගනු ඇත.

දූෂණයට එරෙහිවීම
රජය විසින්:

4.5.36. මසුන් විශුද්ධිකරණය ද ඇතුළුව ධීවර හා ජලජීවී වගා කර්මාන්තය තුළ දූෂණය හා ආර්ථික වංචා සිදු කිරීම වැළැක්වීමට කටයුතු කරනු ඇත.

ධීවර සංගම්
රජය විසින්:

4.5.37. ධීවර ක්ෂේත්‍රයේ ගැටළු විසඳීමට මෙන්ම ධීවර යහපැවැත්ම සහ තීරණ ගැනීමේ අවස්ථාවල දී ධීවර ප්‍රජාවන් නියෝජනය කිරීම සඳහා ධීවර සමූපකාර සංගම් පිළිගැනීමට ලක් කිරීම, බලාත්මක කිරීම හා ශක්තිමත් කිරීම කරනු ඇත.

4.5.38. ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණයේ දී ධීවර සමූපකාර සංගම් සම්බන්ධීකරණය කරනු ඇත.

## 5. සමාප්තිය

"V 2025, සමෘද්ධිමත් රටක්" යන රජයේ ආර්ථික ප්‍රතිපත්ති රාමු ලේඛනය අනුව යමින් මෙම ප්‍රතිපත්තිය සම්පාදනය කරන ලදී. දැනුම් - පාදක, ඉහළ තරඟකාරීත්වයකින් හෙබි, සමාජ - ආර්ථික වෙළඳපොළක් සහිතව ඉන්දියන් සාගරයේ කේන්ද්‍රස්ථානය බවට ශ්‍රී ලංකාව පරිවර්තනය කරමින් වසර 2025 වන විට එය සමෘද්ධිමත් රටක් බවට පත් කිරීමේ රජයේ ආර්ථික දැක්ම යථාර්ථයක් කර ගැනිමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් දායකත්වයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

මෙම අංශයේ සංවර්ධනය සඳහා රජයේ භූමිකාව, සංවර්ධනයේ තිරසාරත්මක බව හා සංවර්ධන ප්‍රතිලාභ සමාන ලෙස බෙදීයාම තහවුරු කිරීමේ අරමුණු පෙරදැරිකොට ගත් කළමනාකරණයකට මූලිකවම සීමා වී පවතී. පෞද්ගලික අංශය විසින් මෙම අංශයේ වාණිජ කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වෙතත්, ස්වකීය පිළිගෙවුම් කාලසීමාවන් (payback periods) දීර්ඝ වීම හේතුවෙන් පෞද්ගලික අංශය විසින් ආයෝජනය කිරීමට මැලි විය හැකි, යටිතල පහසුකම් සංවර්ධනය වැනි ඇතැම් ක්ෂේත්‍රයන්හී ආයෝජනය කිරීමට රජය තවදුරටත් කටයුතු කරනු ඇත.

සහභාගීත්වය සහ සාකල්‍ය ක්‍රමවේදයක් හරහා සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වය සහිතව ඵලදායී පාලන සහ කළමනාකරණ යාන්ත්‍රණ මගින් ධීවර හා ජලජීවී වගා කර්මාන්තයේ තිරසාරාත්මකභාවය තහවුරු කිරීමට මෙම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂා කෙරේ. එවන් ක්‍රමවේදයක් මගින් පරිසර පද්ධති සෞඛ්‍ය ඉලක්ක හා මානව සංවර්ධන ඉලක්ක යන දෙවර්ගයම සපුරා ගැනීම තහවුරු කරනු ඇත. සියළුම පාර්ශ්වකරුවන්ට ප්‍රතිලාභ සලසන්නා වූ දැනුම්-පාදක හා තිරසර හා නවීන කර්මාන්තයක් බවට ධීවර කර්මාන්තය හා ජලජීවී වගාව පරිවර්තනය කිරීම මෙහි අවසන් ඵලය වනු ඇත.